


# ඔබත් ඔහොම ඔතැන ඉන්න

"මොකක් ද අප්පා ඔය අමුතුම සුවඳ ?" පන්හිඳ කුස්සිය දිහාවට ඉව කළා.
"මොනවද ඔය කසායක් වගේ ?" ලිපේ රත්වෙන සාස්පානට එබෙන ගමන් පන් පින්සලගෙන් ඇහුවා.
"කොකා කෝලා... අර ඉතිරිවෙලා තිබුණ දසමූලාරිෂ්ටෙ ටිකක් එක්ක රත්කලා බලන්න."
"මොකක් මනුස්සයෝ ඔය වැඩේ තේරුම ?" ඒ පන්.
"ගෙදර තියෙන තේ කොළවලින් තේ හැදුව ම කට හරියෙ තියන්න බෑ. හුළං ගැහිල ද කොහෙද ? දසමූලෙ ටිකකට කෝක් ටිකක් දාලා බිව්වොත් මක්වෙයිද බලන්න හිතුණා" ඒ පින්.
"ඒක හොඳා බඩ සුද්ද වෙන්නත් එක්ක."
ලංකාවෙදි සරුවත් වතුරයි "පෝටෙලොයි" එකට දාලා බීලා වෙච්ච සංගෙදිය පන්ට සිහිවුණා.
"බඩ සුද්ද වෙලා හරි ඇඟට සනීපනං මොකද ? දසමූලෙ හින්දා ඇඟට අගුනයක් වෙන එකක් නෑ මයෙ හිතේ."
"රත් කළාම මොනව වෙයිද කව්ද දන්නෙ ?"
"මේ වින්ටර් එකේ කූල් කරන්නද එහෙනං කියන්නෙ ?" පන් දුම් දමන බීම ටික "මග්" එකට දමාගත්තා.
"සන්නසට අඳින කරන දෙයක් අහවර කරලාම ඕක බිව්වොත් හොඳා !" කොහෙන් කෙළවරක් වෙයිද හිතාගන්න බැරිව පන් කිව්වා.
"අහලා නැද්ද ?. අළුත් අළුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී." පින් "මග්" එකක් අරගෙන කාමරයට රිංගුවා. "නිවහල් සිතුවිලි මවනා සිතත් උදාරයි." ඩොල්ටන් අල්විස් මහත්තයා ලියලා අමරදේව තුමා ගායනා කරපු සින්දුව සිව්රහන් බාන ගමන් පන් ලියන මේසේ උඩ තියෙන පොත් පත් එහා මෙහා කරලා ලියන්න ඉඩක් හොයා ගත්තා.
දසමූලාරිෂ්ටය කියන්නේ සිංහල වෙදකමේත්, ආයුර්වේදයේත් එන ඖෂධ ක්‍රමවේද වලට අනුව කරපු නිශ්පාදනයක්. ආයුර්වේදයේ මූලාරම්භය ඉන්දියාව කියලයි කියන්නේ.
කොකාකෝලා අපරදිග සංස්කෘතියන් එක්වුණ බීම වර්ගයක්. මේ දේවල් එක් කරලා පින් අලුත් දෙයක් කරන්න හැදුවා වගේ නොයෙක් සංගීත ක්‍රමවේදයන් එකතු කරලා නැවුම් දෙයක් කළ විශිෂ්ට සංගීතවේදියෙක් ගැන පන්ට කල්පනා වුණා.
දසන්තයේ හමන චණ්ඩ මාරුතයන්ට හසුව අයාලයේ යන්නා වූ සිංහල ගීතය පිළිබඳව විවිධාකාර අදහස්, කතිකාවන් නැංවෙන මෙවන් වකවානුවක විමසීමට ලක්විය යුත්තකි වික්ටර් රත්නායක ගීතාවලිය සහ නිර්මාණාවලිය. සැබැවින්ම මෙවන් කෙටි සටහනකින් විමසන්නට සිතීමටවත් නොහැකි වුවද, රසික පාඨකයින්ගේ මතකය යම් පමණකින් හෝ අවුලවාලන්නටය මේ උත්සාහය. ඔවුන්ගේ අවධානය යොමු කරවීමටයි මේ උත්සාහය.
අන් අයෙකුගෙන් කෑ "ටොක්කක්" පිළිබඳවයි රත්නායකයන්ගේ සංගීතමය ගමන් මගෙහි මුල්ම මතකය. අසල්වැසි නිවසක පැවැත්වුණ සාජ්ජයක් බැලීමට ගිය වික්ටර් කොලු ගැටයා සාජ්ජ කරුවන් නිවැසියන්ගේ සංග්‍රහ භුක්ති විඳීමට නිවෙස තුලට වන් ඉසිඹුවේ දී නිවෙසට පැන ෆුටි බැලෝ සර්පනාව වැයූ අන්දමත් ඔවුන්ගෙන් එකෙකු එහි විත් "ටොක්කක්" ඇන පළවා හැරි අන්දමත් ඔවුන්ගෙන් එකෙකු එහි විත් ගීත රචක ගීතනාත් කුඩලිගමයන් සංස්කරනය කළ "ගී සියයක්" ග්‍රන්ථයෙහි සටහන් තබන්නේ සොම්නස් සිතිනි. සිද්ධිය සැළ වූ සිය පියාණන් ඒ වර්ගයේම පයින් සුළං පිඹිමින් දෑතින් වැසිය යුතු ෆුටි බැලෝ සර්පිනාවක් ගෙනැවිත් දීම තමන්ගේ ගමන් මගෙහි ඇරඹුම විනැයි රත්නායකයන් සිහිපත් කරයි.
සර්පිනාව වැයීමට තරම් උසින්වත් නොවැඩුණ කොළු ගැටයා කොට්ටයක් මත හිඳිමින් කළ සර්පිනා වාදනය මුළු කඩුග න්නාවේ මතු නොව අවට ගම් වල පවා පැවැත්වුණ සාජ්ජ වල දක්නට ලැබුණ සුපුරුදු අංගයක් විය. ඊට එක් වූ හින්දි ගී ගායනය ද සැවොම තුටු කරවන්නක් වීය. මහනුවර එම්.ජී.පී. කාලායතනයේ අධිපති සිරිල් පෙරේරා සංගීත ආචාර්යවරයාගේ මඟ පෙන්වීම අනුව වයලීනය තුරුළු කර ගත් වික්ටර් තරුණයා ක්‍රමයෙන් ඒ සෙවනේ ශිල්පීය නිපුණත්වය ලබමින් ද හැටේ දශකයේ මුල් භාගයේ හමු වූ ආර්. ඒ. චන්ද්‍රසේන සංගීතවේදියාණන් යටතේ වයලීන වාදකයෙකු වශයෙන් අත්දැකීම් ගොනු කරගනිමින් ද



සිය කුසලතා වඩවා ගත්තේය. ගායනය හා වාදනය දෙ අංශයෙන්ම විභාග සමත්ව රජයේ සංගීත විද්‍යාලයට ඇතුළු වීමත්, ඒ ශ්‍රේණියේ ගායකයෙකු වශයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් තෝරා ගැනීමත් සිය ගමන් මගෙහි පිය සටහන් ලෙසින් රත්නායකයෝ සටහන් තබති.
නියමිත ස්වරස්ථාන සළකුණු නොකෙරුණා වූ වයලීනය වැනි වාද්‍ය භාණ්ඩයක් වැයීමෙන් ශ්‍රවණේන්ද්‍රිය සංවේදී කරගෙන පසු කාලීනව ගායන ක්ෂේස්ත්‍රයට පිවිසි ශිල්පීන් කිහිප පොළකි පණ්ඩිත් අමරදේවයන් ශිල්පී ටී. එම්. ජයරත්නයන් හා ශිල්පී අමරසිරි පීරිස් ගායකයාණන්. ඔවුන් අතරින් ගායනයෙහි මතු නොව නිර්මාණකරනයෙහිත් එක සේ හපන්කම් පෑ රත්නායකයන් දෙවැනි වෙතොත් ඒ පණ්ඩිත් අමරදේවයන්ට පමණි. සමස්ථ හෙළ ගී පුරාවත ම සිසාරා සොයා බැලුවද රත්නායක නිර්මාණ හා ගායනා දායකත්වය අභිබවා යන්නට හැකි වූවකු වේ දැයි සිතනු නොහේ. ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක අතින්ද ඉහළ වන්නේය එකී දායකත්වය. සරු ගී කිහිපයකට දායක වී තමන් කළ ගීත සියල්ල උසස් යැයි පෞද්ගලික අසමානයක් නංවා ගන්නේ ප්‍රතිශතය පිළිබඳව උනන්දුවන්නෝ නොවෙද? ඉන් රසිකයිනට හෝ ක්ෂේස්ත්‍රයට වන යහපත කිම ? විශාල වශයෙන් නිර්මාණ කරන්නන්ගේ සරු පළ වල ප්‍රතිශතය ඔවුනට පෞද්ගලිකව අවාසිදායී වුවද ප්‍රමාණාත්මකව සරු නිර්මාණ හා ගායනා සමාජයට දායාද වන්නේ නොවේද ?
ගීතනාත් කුඩලිගමයන් සංස්කරණය කළ "ගී සියයක්" සහ "මාරුතයේ මියුරු සර" කෘතිවල ඇතුලත් කෙරුණු ගීත නාමාවලිය රත්නායක ගීතාවලියේ මතු නොව නිර්මාණවලියේ ප්‍රමාණාත්මක බවට සාක්ෂි දරයි. ඒවායේ සරු බව සිහිපත් කරවයි.
සිය මුල්ම ගුවන් විදුලි ගීත වූ අරිසෙන් අහුබුදු ශූරීන් විසින් රචිත "සිඳ බිඳ මොහඳුරු පාප" බොදු ගීතයෙන් සහ "ගොළු මුහුදේ මුතු ඇටේ" දේශාභිමානී ගීතයෙන් අරැඹි ගායනයේ මතු නොව තනු නිර්මාණකරනයේ විශිෂ්ටත්වය මේ වන විට ලොව සියලු දේශයන් සිසාරා සිහල සිත් මතු නොව අන් සිත් සතන් පවා සනහාලන්නේය. සිංහලයේ වැඩිම බොදු ගුණ ගීත පමණක් නොව, දේශාභිමානී ගීත, මවු ගුණ ගීත ප්‍රමාණයකට සිය හඬ දායක කළා වූ ගාන්ධර්වයා වන්නේ රත්නායකයන් බවට ඉහත කී ලයිස්තු සාක්ෂි දරන්නා සේ ය.
විශ්වාකර්ශනීය වූ සිය මධුර හඬ සිය අනන්‍යතාවය සමඟින් විවිධාකාර වූ ඉසව් කරාද, විවිධාකාර වූ සංගීත ක්‍රමවේදයන් කරා ද නොබියව විහිදුවාලූවා රත්නායකයෝ. තාරුන්‍යයේ "රොමැන්ටික්" කට හඬ හා මුහු නොවූ ලලනා ගායනා හඬක් නැති තරම්ය. එය රුක්මනී දේවියගේ පටන් උරේෂා රවිහාරි දක්වා විහිදි පරාසයකි. රත්නායකයන්ගේ හඬ ඒ සියළු හඬ සමඟ පෑහිමය විශ්මය. එය ගායිකාවනට පමණක් සීමා නොවේ. පණ්ඩිත් අමරදේව, නිපුන් සනත් නන්දසිරි, අයිවෝ ඩෙනිස්, මිල්ටන් මල්ලවාරච්චි, එච්. ආර්. ජෝතිපාල, සිසිර සේනාරත්න, එම්. එස්. ප්‍රනාන්දු, එඩ්වඩ් ජයකොඩි, සුනිල් එදිරිසිංහ යන නාමයන් එකී විෂමත්වය හුවා දක්වන යුග ගායනාවන් හා බැඳි නම් කීපයක් පමණෙකි.
මන්ද්‍ර "ම" ස්වරයේ පටන් උච්ඡ "ප" ස්වරය දක්වා පහසුවෙන් ළඟාවෙන ස්වර පරාසයකි හඬෙහි ඇත්තේ. නියමිත ස්වර්ස්ථාන තාලස්ථාන යනාදියෙහි මනාව පිහිටමින් අලංකාර අත්‍යාලංකාරයෙන් නලවා ගැයෙන එම හඬෙහි විටෙක ගැබ් වන්නේ පෙම්වතෙකුගේ ළයාන්විත බවයි. තවත් විටෙක භක්තිවන්තයෙකුගේ බැතිබර බවයි. තවත් විටෙක දේශාභිමානයෙන් ඔද වැඩුන විරුවෙකුගේ පෞර්ෂයයි. මේ සියල්ල කැටිකර ගනිමින් වික්ටර් රත්නායකයන් රසිකයිනට - ගෙන ආවේ කිමෙක් ද, පළමුව නැවුම් බවයි. දෙවැන්න විවිධත්වයයි. තෙවැන්න සංගීතයේ අරුත් බර බවයි. අවසන විශ්මයයි.
"සිසිල් සුළං රැල්ලේ" ගීයෙහි නැවුම් බව අද ද විඳින්නෙමු. එහි තනු හා සංගීත නිර්මාණය පෙර දිගද - අපරදිගද යන්න කිසිවකුට වෙන් කරගත නොහේ. පාරු කවි මූලාශ්‍ර කරගත් "තොටුපළ අයිනේ" දිගින් දිගටම වැයෙන්නේ ගිටාරයයි. ගිටාරයට වස්දඬු රාවය එක්වුණ මුල්ම සංගීත අත්දැකීමයි මේ. රාගධාරී සංගීතයෙන් ඇරඹෙන "රාධා" ගීතයට නන්දා මාලිනී විශාරදවරිය මුහුවන්නේ එහෙම පිටින්ම අපරදිග නාද රටාවන්ට අනුවයි. "නීල බිඟු කැල", අඳුර බිඳින්නට අපරදිග රටාවට නිදසුන් මෙන් ම "හෝ පාළු වන පෙත් සඟවා ගනු මැන" වැනි ගී රාගධාරී සංගීතයේ ඇසුර ලබයි. "ලබලා තිදැසා" නූර්ති ගී ආකාරයටත්, ප්‍රෙඩී සිල්වා ශිල්පියා ගැයූ "කුණ්ඩුමණී" කර්ණාටක ගී ආකාරයටත් නිදසුන්. "මල්සර උක්දඬු" ගීතය මියැසි වැඩමුළුවක් වැන්න. සිංහල ජන ගීයෙහි එන ගැල් කවි ඇසුරින් නිර්මිත "තනිතරුවේ", නැළවිලි ගී ඇසුරින් නිර්මිත "ආදරයේ උල්පත" වැනි තනු හා සංගිත නිර්මාණ මෙන්ම "තුන්සරණේ" කවි අනුව නිර්මිත "සිරිමා බෝ වැලි මලුවේ" පිරිත් සජ්ජායනා ආරයට නිර්මිත සමූහ ගායනා ගැයෙන "නිවන් දුටු හිමි" "බුදු හාමුදුරුවො" වැනි ගීත මෙහි ලා පෙළ ගන්වන්නේ නිදසුන් කිහිපයක් ලෙසිනි.
රත්නායක ප්‍රේම ගීතාවලිය එකිනෙකට පරස්පර අන්තයක් කරා යොමු වූ අපූරු නිර්මාණාවලියක් නොවේද ? "පොඩි කුමාරි හාමිනේ", බින්දුමතී "මීන නුවන්", සඳට අහස ආදරේදෝ", "සිනාදොලක් වන්" "සිහින සතක්", "ආශා නිරාශා", "සඳකැන් වැසිලා"
තමන් වෙතම තනු නිර්මාණ කරගන්නවා වෙනුවට අන්‍යන්ට ද නිර්ලෝභීව තනු හා සංගීත නිර්මාණ දන් දීමෙහි ද කිසිවකුට නොදෙවෙනි වූවෙකි වික්ටර් රත්නායකයන්.
පණ්ඩිත් අමරදේවයන් ගැයූ කුමරියක පා සලඹ සැළුනා, බඹර පැටික්කී, විශාරද නන්දා මාලිනිය ගැයූ "මට මව් පදවිය", "රුවන් මුවා පොළෝ තලේ", සුනිල් එදිරිසිංහයන් ගැයූ "සඳකඩ පහණක", "වෙරළු ගෙඩිය", "සොයා පිළිසරණක්", "බානෙන් බැඳ" වැනි ගීත මෙන්ම ප්‍රෙඩී සිල්වා ශිල්පියාණන් ගැයූ "පාන් කිරිත්තා", එච්. ආර්. ජෝතිපාල ශිල්පියාණන් ගැයූ "රාජ කිරුළු පලන්දාපු" බන්දුල විජේවීරයන් ගැයූ "කුල ගෙදරින්", මිල්ටන් මල්ලවාරච්චි ගැයූ "සුන්දරත්වයෙන් පිරි", "දෙඅදර විලිකුන්" සිය ගණනක් වූ ජනප්‍රිය නිර්මාණ අතුරින් කිහිපයකි. අබේවර්ධන බාලසූරිය ශිල්පියාණන් වෙනුවෙන්ම නිර්මාණ කළා වූ තනු ප්‍රමාණය හැත්තෑවකට අධික වන අතර ඉන් බොහොමයක් ම ජනප්‍රිය ඒවා වේ. නෙරංජලා සරෝජිනිය රත්නායක නිර්මාණ විස්සකට අධිකව ගයා ඇත්තීය.
චිත්‍රපට හා ටෙලි නාට්‍ය සංගීත අධ්‍යක්ෂනය වෙනුවෙන් කළා වූ මෙහෙවරනම් ගැයුණා ද යන්න අදටද ගැටලුවකි. "සිරි බෝ අයියා" චිත්‍රපටය වෙනුවෙන් සම්මානයට පාත්‍ර වුවද "සරුංගලේ" වැනි චිත්‍ර පටයක සංගීත අධ්‍යක්ෂනය නොසලකා හැරීම කණගාටුවකට කාරණයක් නොවේ ද? එකී නිර්මාණයේ විශ්වනීය ගුණය දිරවාගත නොහුනු නිසා ද ඒ?
"අර ඩ්‍රින්ක් එක පත්තියං වුණා" පින් පන්ගෙ කාමරයට එබුනේ තමුන් ඇඳපු චිත්‍ර සටහනකුත් අරගෙන.
"ආ තමුන්නැහේ යහතින් නං හොඳා !" පන් ලියවිල්ල හමාර කළේ "ඔබත් ඔහොම ඔතැන ඉන්න..." සින්දු කෑල්ලකුත් කියාගෙන.
කාට පන්තියක් නොවුනත් කලාව විඳින රසිකයින්ට පත්තියං කරවන්න පුළුවන් රස - ගුණ තියෙන අලුත් උණුසුම් දෙයක් දෙන්න දඟලන අය ගැන, දඟලපු අය ගැන පොඩ්ඩක් හරි හිතන්න පුළුවන්නං හොඳයි. පන් තමන්ටම කියා ගත්තා.

සිසිර දිසානායක